වී වගාවේදී ගොවීන් මුහුණ දෙන ප්‍රධානතම ගැටළුව ප්‍රමාණවත් ලාභයක් නොලැබීමයි. ශ්‍රමය සඳහා ගෙවීමට සිදුවන අධික වියදම එයට හේතු වී ඇත. මූලික බිම් සැකසීම, වල් මර්ධනය, අස්වනු නෙලීම, අස්වනු මැඩීම, අස්වනු සැකසීම සඳහා ශ්‍රමය විශාල වශයෙන් යෙදවීමට සිදුවන බැවින්, ඒ සඳහා වැයවෙන වියදම දැරිය නොහැකි තත්වය නිසාම වී වගාවේදී ගොවීන් දැඩි අසීරු තත්ත්වයකට පත්වී ඇත. එබැවින් ඇතැම් ප්‍රදේශවල වී වගාවට ඇති උනන්දුව අවම මට්ටමක පවතී.

ශ්‍රම ඌනතාවයේදී පවතින ගැටළුවලට සාර්ථක විසඳුමක් වශයෙන් මහඉලුප්පල්ලම ගොවිපල් යාන්ත්‍රික පර්යේෂණ මධ්‍යස්ථානය මගින් වී වගාව යාන්ත්‍රීකරණය සඳහා විශේෂ උපකරණ කට්ටලයක් හඳුන්වා දී ඇත.

## බිම් සැකසීම

මඩ වී වගාව සඳහා ක්‍රමානුකූලව බිම් සැකසීම සිදුකල යුතු අතර, පළමුව ප්‍රමාණවත් ජල සම්පාදනයකින් පසුව හැඩතල නගුල සහ කොකු නගුල යොදා බිම් සැකසීම කල යුතුය.

පසුව ද්විතියික බිම් සැකසීම රොටවේටරය මගින් සිදුකර අවසාන බිම් සැකසීම වශයෙන් ක්‍රමානුකූලව පෝරුවෙන් මට්ටම් කිරීමෙන් අනතුරුව ප්‍රමාණවත් ජල සම්පාදනයකින් පසුව හොඳින් සකසා ගත් කුඹුරෙහි වී වගාව ස්ථාපනය කල යුතුවේ.

## මඩ වී බීජ වප්කරය



කුඹුරුවල පේළියට පැළ වී බීජ දැමීම සඳහා සුදුසු යන්ත්‍රයකි. හොඳින් බිම් සකසන ලද ක්ෂේත්‍රයේ වප්කරය ඉතා හොඳ බිම් සැකසීමක් ඇති ක්ෂේත්‍රයේ වප්කරය ක්‍රියා කිරීමට පහසුවනවා මෙන්ම සාර්ථක බීජ ප්‍රරෝහනයක් ද ලැබෙනු ඇත. බීජ පේළියට වගා කිරීමෙන් වගාව ඉතා පහසුවෙන් නඩත්තු කිරීමේ හැකියාවක් ද ඇති වේ.

## ගොයම් පැළ සිටුවීම

දින 14ත්, 21ත් අතර වයස් ප්‍රමාණයේ වූ විශේෂ ඩැපොග් ක්‍රමයට සැකසූ පැළ තවාන් භාවිතා කර පේළියට ගොයම් පැළ සිටුවන යන්ත්‍රයෙන් දිනකට අක්කර 1/2 - 3/4 ගොයම් පැළ සිටුවීම සඳහා දෙදෙනෙකු ප්‍රමාණවත් වේ.



වී බීජ වැපිරීම හා ගොයම් පැළ පේළියට සිටුවීමෙන් වාසි රැසකි.

- අවශ්‍ය බිත්තර වී ප්‍රමාණය අඩුවීම
- වල් මර්ධනය සඳහා යන්ත්‍ර භාවිතා කිරීමෙන් වියදම අවම වීම සහ පරිසර දූෂණය සිදු නොවීම
- පේළි අතර පහසුවෙන් ගමන් කළ හැකි නිසා පොහොර හා කෘමිනාශක පහසුවෙන් යෙදිය හැකි වීම
- අවම ජල සම්පාදන තත්ත්වයක් යටතේ සාර්ථකව වී වගා කිරීමට හැකි වීම
- බිත්තර වී නිෂ්පාදනයේදී පහසුවෙන් මුහුන් පැල ඉවත් කිරීමට හැකිවීම
- පේළි අතර හොඳින් හිරු එළිය සහ වාතාශ්‍රය ලැබීම නිසා ශාකය හොඳින් වර්ධනය වීම මෙන්ම කීඩෑ හානි සහ වෙනත් දිලීර රෝගවලට භාජනය වීම අවම වීම
- අහිතකර කාළගුණ තත්ත්වයන්හිදී කරලින් බරවූ ගොයම් ඇද වැටීමෙන් වැලකීම

## වී වගාවේ වල් මර්ධනයට කෝනෝ වීඩරය

වී වගාවේදී මල් මර්ධනය විධිමත් පරිදි කල යුතු වේ. මෙය වී වගාවේ අස්වැන්න කෙරෙහි බලපාන ප්‍රබල සාධකයකි. කෝනෝ වීඩරය මගින් වල් මර්ධනය සමඟ පළමු පොහොර යෙදීමද එකවර සිදුකල හැක. මෙහිදී පස බුරුල් වීම, පොහොර පසට මිශ්‍රවීම එකවරම සිදුවේ. දිනකට අක්කර 1/2 පමණ එක් අයෙකුට ඉතා සාර්ථකව වල් මර්ධනය සිදුකල හැක.

මෙහිදී හොඳින් හිරු එළිය ලැබීමත් පොහොර සඳහා තරඟකාරීත්වයක් නොපවතින නිසාත් වගාව සරුවී අස්වැන්න වැඩි වේ.

වල් නාශක ඉසීම අවශ්‍ය නොවන නිසා වියදම අවම වීමත් පරිසර හානිය අඩු වීමත් රසායනික ද්‍රව්‍ය සඳහා විදේශ රටවලට ඇදී යන මුදල් ඉතිරිවීමත් විශේෂ වාසියකි.



## ගොයම් කැපීම

ගොයම් කැපුණු පසු නිසි වේලාවට කපා ගැනීමටත්, කම්කරු හිඟයට සුදුසු පිළියමක් ලෙසත් දැනට භාවිතයේ පවතින රෝද දෙකේ ට්‍රැක්ටරයට සවිකල හැකි ගොයම් කැපීමේ උපාංගයක් ගොවිපල් යාන්ත්‍රික පර්යේෂණ මධ්‍යස්ථානය මගින් ගොවි ජනතාව වෙත හඳුන්වා දී ඇත.

මෙම යන්ත්‍රයෙන් දිනකට අක්කර 04 ක පමණ ගොයම් කපා ගත හැකි අතර අස්වනු හානිය 1% ටත් වඩා අඩුය.



## කොළ මැඩීම

### අධිධාරිතා කොළ මැඩීමේ යන්ත්‍රය

රෝද දෙකේ ට්‍රැක්ටරය මඟින් ක්‍රියාකරවිය හැකි මෙම යන්ත්‍රයෙන් සිදුවන අස්වනු හානිය මෙන්ම කාටු මගින් පරිසර හානියද අවම වේ. අක්කරයක කොළ මැඩීමට පැය 1 1/2 ක පමණ කාලයක් ගනී.



### සංයුක්ත අස්වනු නෙලනය

රෝද දෙකේ ට්‍රැක්ටරයට සම්බන්ධ කර ක්‍රියාකරවිය හැකි මෙම යන්ත්‍රය මගින් අස්වනු කපා පාගා වී ගෝනිවලට එකතු වීම ස්වයංක්‍රීයව සිදුවේ.



### බිත්තර වී පිරිසිදු කිරීමේ යන්ත්‍රය

සාම්ප්‍රදායික තත්ත්වයෙන් ලබා ගන්නා වී බිත්තර වී වශයෙන් සකස් කිරීම සඳහා වී පිරිසිදු කිරීමේ යන්ත්‍රයක් ගොවිපල් යාන්ත්‍රික පර්යේෂණ මධ්‍යස්ථානය මගින් හඳුන්වා දී ඇත.



මෙම යන්ත්‍රය මගින් වල් ඇට, බොල් සහ වෙනත් සියළුම අපද්‍රව්‍ය ඉවත්කර උසස් තත්ත්වයේ බිත්තර වී පැයකට කි.ග්‍රෑම්. 150 ත් 200 ත් අතර ප්‍රමාණයක් සකසා ගත හැක.

ඉහත උපකරණ නිසි පරිදි නිසි කලට භාවිතා කිරීමෙන් කාලය, ශ්‍රමය, වියදම අඩුවීමෙන් වඩාත් සරු ඵලදායි සහ ගුණාත්මක භාවයෙන් ඉහළ සරු අස්වැන්නක් මගින් වැඩි ආදායමක් ලබා ගැනීමට හැකි වීමෙන් ගොවි ජීවිතය සරුවනු දැකීම අපගේ පැතුමයි.

ඉහත උපකරණ මිලදී ගැනීමට හෝ නිෂ්පාදනය කිරීමට ඔබ බලාපොරොත්තු වන්නේ නම්, ඒ සඳහා අවශ්‍ය තාක්ෂණික උපදෙස් හා පුහුණුව නොමිළයේ අප ආයතනය මගින් ලබාගත හැක.

**වැඩි විස්තර සඳහා:**

*නියෝජ්‍ය අධ්‍යක්ෂ,*
*ගොවිපල යාන්ත්‍රික පර්යේෂණ මධ්‍යස්ථානය,*
*මහඉලුප්පල්ලම*

*දුරකතන, ෆැක්ස්:* 025-2249222
*ඊමේල්:* fmrc@sltnet.lk

**අපි වවමු - රට නගමු**

Designed by: **AUDIO VISUAL CENTRE**, Department of Agriculture, Peradeniya.
Printed by: **AGRICULTURE PRESS**, Gannoruwa.

# වී වගාව යාන්ත්‍රීකරණ කට්ටලය

